# ලාංකීය බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය කෙසේ සිදු වූයේද?

පී. ඒ. පී. කේ. ගුණවර්ධන.
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
priyanthagunawardhana06@gmail.com

**සංක්ෂේපය**

බුදු දහම හා සම්බන්ධ පූජනීය සංකේත අතර බුදු පිළිමයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සම්බන්ධයෙන් විද්වතුන් විසින් විවිධ මත ඉදිරිපත් කරනු ලබයි. බොහෝ විද්වතුන් බුද්ධ ප්‍රතිමාව ඉන්දියාවේ ආරම්භ වූ බව ප්‍රකාශ කරන අතර ඇතැම් විද්වතුන් ශ්‍රී ලංකාවේ බුදු පිළිමය ආරම්භ වූ බවට මත ඉදිරිපත් කර තිබේ. මෙම අධ්‍යනයේ අරමුණ වූයේ එකී විද්වත් මත තුලනාත්මකව විමර්ශනය කරමින් බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය කවදා කෙසේ කොතැනකදී සිදු වූයේද යන්න සොයා බැලීමයි.

මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම ද්විතීය මූලාශ්‍රය ද පරිශීලනය කරනු ලැබීය. එමෙන්ම සාහිත්‍ය මූලාශ්‍රයවලට අමතරව පුරාවිද්‍යාත්මක හා විදේශීය මූලාශ්‍රය ද, මේ සඳහා උපකාරී විය. තවද ලොව පුරා බුදු රුව නිර්මාණය සම්බන්ධයෙන් ඇති ජනප්‍රවාද ද සුපරීක්ෂාකාරී ලෙස විමර්ශනය කිරීම මෙහිදී සිදු විය.

බුදු පිළිමයේ ආරම්භය සම්බන්ධයෙන් මත කිහිපයක් ඉදිරිපත් වී ඇත. ඉන් එක මතයකින් ප්‍රකාශ වන්නේ බුදු පිළිමය බුදුරදුන් ජීවමාන කාලයේදීම නිර්මාණය වූ බවයි. ඒ පිළිබඳ සාධක කෝසල බිම්බවර්ණනාවේ සහ චීන මූලාශ්‍රයවල සඳහන් වී තිබේ. මින් අනෙක් මතය ඉදිරිපත් කරන පිරිස ප්‍රකාශ කර සිටින්නේ ලොව ප්‍රථම වරට බුදු රුව නිර්මාණය වූයේ ක්‍රි.ව පළමුවන ශතවර්ෂයේදී බවයි. බුද්ධ නියමයට එරෙහිව යමින් කණිෂ්ක රජුගේ කාලයේ ඉන්දියාවේ මෙලෙස බුදු රුව නිර්මාණය වීමට මහායානික බුදු දහමේ බලපෑම හේතු වන්නට ඇතැයි ඔවුන් ප්‍රකාශ කරනු ලබයි. මෙය වඩාත් පිළිගන්නා වූ මතය වේ. නමුත් වර්තමානයේ වඩාත් ආන්දෝලනයට පත්ව ඇති මාතෘකාව වන්නේ බුදු පිළිමය ලංකාවේ ආරම්භ වූයේය යන මතයයි. මෙම ප්‍රශ්නයට විසඳුමක් ලබා ගැනීම මෙම පරීක්ෂණයේ ප්‍රමුඛ අරමුණ විය. මෙකී සාධක සලකා බැලූ කළ පෙනීයන්නේ ලංකාවේ බුදු පිළිම නිර්මාණය වූයේ ක්‍රි.ව. පළමුවන සියවසට ප්‍රථම බවයි.

**ප්‍රමුඛ පද :- ලංකාව, බුදු පිළිමය, ආරම්භය**